# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2264/63 – 2022 ජනවාරි 28 වැනි සිකුරාදා – 2022.01.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2019/10.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. ඒ. රෝහිත පෙරේරා මයා, අංක 84, විශ්වකලාව නව නිවාස, මාම්පේ, පිළියන්දල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කටුගස්තොට, ගුහාගොඩ පාර, අංක 85/සී, ඩබ්. එම්. එස්. ඩී. වීරකෝන් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

නිමල් සිරිපාල ද සිල්වා,
කම්කරු අමාත්‍ය.

2022 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ දී ය.

1A – G 35944 – 15 (2022/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/05/2019/10.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. ඒ. රෝහිත පෙරේරා මයා, අංක 84, විශ්වකලාව නව නිවාස, මාම්පේ, පිළියන්දල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන ලද,

1. එම්. ඒ. රෝහිත පෙරේරා මයා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/89 (vii) පරිදි නැවත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවයට වාර්තා කිරීමට ගිය ද, ඒ මහතාට සේවයට වාර්තා කිරීමට අවකාශ ලබා නොදීමත්,

2. 2015.12.21 දින නැවත සේවය පිහිටුවීමේ දී වාර්තා / චක්‍රලේඛ උල්ලංඝනය වන ලෙස පත්වීම් දී තිබේ ද? යන්නත්,

මගින් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේ ද? තිබේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 01 - 0315

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.